

# 1 රටේ සංවර්ධනයට කෘෂිකර්මයේ දායකත්වය අගය කරමු.

**මෙම පාඩම හැදෑරීමෙන් ඔබට,**

- කෘෂිකර්මයේ විකාශය අගය කිරීමටත්
- රටේ ආහාර සුරක්ෂිතතාව  තහවුරු කිරීමට දායක වීමටත්
- නිසි පෝෂණය ලැබීම තුළින් රටේ සංවර්ධනයට හවුල් වීමටත්
- කෘෂිකර්මය මඟින් රට සංවර්ධනය සඳහා සුදුසු සැලැසුම් යෝජනා කිරීමටත්

**අවශ්‍ය නිපුණතා ලබාගත හැකි ය.**



## කෘෂිකර්මය යනු,

තැනින් තැනට සංක්‍රමණය වෙමින් ආහාර සොයා යමින් සිටි මිනිස්සු පසු කාලීන ව ජලාශ ආශ්‍රිත ව වාසස්ථාන තනා ගෙන ජීවත් වීමට පටන් ගත් හ. ඒ සමග ම තම අවශ්‍යතා සපුරා ගැනීමට බෝග වගා කිරීමට ද ඔවුහු යොමු වූහ. මෙය ගොවිතැනේ ආරම්භය යි.

බෝග වගාව මුල් කර ගත් ගොවිතැනට සත්ව පාලන කටයුතු එක් වූ පසුව එය කෘෂිකර්මය ලෙස හඳුන්වනු ලැබීය. මෙයින් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ප්‍රධාන අංශ දෙකක් ඇති බව පැහැදිලි වේ.

1. බෝග වගාව
2. සත්ත්ව පාලනය

වර්තමානයේ කෘෂිකර්මය යනු මීට වඩා පුළුල් පරාසයක විහිදුණු ක්ෂේත්‍රයකි. ජලය, වාතය , භෞමික සම්පත්, ධීවර කර්මාන්තය, වන සම්පත්, ආහාර තාක්ෂණය, කෘෂි යාන්ත්‍රීකරණය යනාදි ක්ෂේත්‍ර රැසක් අද කෘෂිකර්මයට එක් වී ඇත.

මේ නිසා නවීන විද්‍යාව හා තාක්ෂණය ප්‍රායෝගික ව භාවිත කරන ව්‍යාවහාරික ක්ෂේත්‍රයක් ලෙස කෘෂිකර්මය හැඳින්විය හැකි ය. කෘෂිකාර්මික සම්පත් බහුල අප රටේ ජාතික සංවර්ධනයට කෘෂි ක්ෂේත්‍රය සංවර්ධනය කළ යුතු ය.

මේ සඳහා ශ්‍රී ලාංකීය කෘෂිකර්මාන්තයේ පසුබිම පිළිබඳ ව දැන සිටීම වැදගත් වේ.

## 1.1 කෘෂිකර්මයෙහි විකාශය අගය කරමු.

අතීතයේ සිට ම කෘෂිකර්මය ශ්‍රී ලංකාවේ ආර්ථිකය නැංවීමට දායක වූ බව පහත දැක්වෙන  සාක්ෂිවලින් මනා ව පැහැදිලි වේ.


- විජයාවතරණය සිදු වන අවස්ථාවේ කුවේණිය කපු කටිමින් සිටි බවට ඉතිහාසයේ සඳහන් ව ඇත. මෙය එකල කපු වගාව හා ඒ ආශ්‍රිත කර්මාන්ත පැවති බවට සාක්ෂියකි.
- වල්ලි අම්මා මැණියන්ට කතරගම දෙවියන් මුණ ගැසෙන අවස්ථාවේ දී ඇය මෙනේරි යායක පක්ෂීන් පලවා හරිමින් සිටි බවට හින්දු ආගමික පුරාවතෙහි සඳහන් ව ඇත. මෙයින් එකල මෙනේරි වගාව පැවති බව වටහා ගත හැකි ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.



රූපය 1.1 : අතීත ශ්‍රී ලංකාවේ කෘෂි සශ්‍රීකත්වය




රූපය 1.2 : වැවක ප්‍රධාන අංග



රූපය 1.3 : මින්නේරිය වැව

- වැව්වලින් පෝෂණය වන කෘෂිකර්මය හා බැඳුණු සංකීර්ණ ජනාවාස රටාවක් වියළි කලාපයේ වූ බවට සාක්ෂි අදත් ඇත.
- පුරාණ ගමෙහි වැව් තිබූ බව **වාපී** යන පදයෙන් පැහැදිලි වේ. එම වැව් ස්වාභාවික පෝෂිත ප්‍රදේශ ආශ්‍රිත ව අන්‍යෝන්‍ය ව සම්බන්ධ ව ඇති වැව් සමූහයක් වශයෙන් විද්‍යාත්මක පදනමකට අනුව නිර්මාණය කර තිබිණි. මෙහිදී එක් වැවකින් පෝෂණය වන ප්‍රදේශය ඊට පහළින් ඇති වැවේ පෝෂක ප්‍රදේශය ලෙස සකස් ව තිබිණි. එය එල්ලංගා පද්ධතිය (cascades system) ලෙස හැඳින්වේ.
- ඉතිහාසයේ කියැවෙන **වැවයි දාගැබයි** සංකල්පය පුරාණ ගමෙහි කෘෂිකර්මය හා බැඳුණු සංස්කෘතියක් පැවති බව කියා පෑමකි.
- කෘෂිකාර්මික කටයුතු සඳහා රජවරු වැව් රැසක් ඉදි කළ බැවින් අනුරාධපුරය **වැව් බැඳි රාජ්‍යය** ලෙස හඳුන්වනු ලැබීය. මෙයින් එම ප්‍රදේශයේ විශාල වගා වපසරියක් තිබූ පැහැදිලි වේ.
- මහසෙන් රජු **මින්නේරි දෙවියෝ** ලෙස දේවත්වයෙන් පුදනු ලැබුවේ ඔහු කෘෂිකර්මයට අවශ්‍ය ජල සම්පාදනයට ඉහළ අනුග්‍රහයක් දක්වූ බැවිනි.
- අනුරාධපුර හා පොළොන්නරු යුගවල ශ්‍රී විභූතිය එකල සහල් අපනයනයෙන් සංකේතවත් වේ. මෙය දකුණු ඉන්දියාවේ සංගම් සාහිත්‍යයට අයත් **පට්ටිනපාලෙයි** නම් දෙමළ කෘතියෙහි සඳහන් වේ. එහි 'ඉල්ලත්තුනාවු' හෙවත් ශ්‍රී ලංකාවෙන් දකුණු ඉන්දියාවට ආහාර ද්‍රව්‍ය ගෙන ගිය බව දක්වා ඇත. මෙහි සහල් අපනයනය පිළිබඳ ව සඳහන් නොවූවත් සහල් ප්‍රමුඛ වූ බව අනුමාන කළ හැකි ය.
- පැරකුම්බා රජ සමයේ ශ්‍රී ලංකාව **පෙරදිග ධාන්‍යාගාරය** ලෙස විරුදාවලිය ලැබීමෙන් ද එකල පැවති ස්වයංපෝෂිත කෘෂි ආර්ථිකය මනා ව පිළිබිඹු වේ. "**වැස්සෙන් හට ගත් ජලය මදකුත් ලෝකෝපකාරයේ වෙන් ව කිසි කලෙකත් මුහුදට නොයේවා**"යන පරාක්‍රමබාහු රජුගේ කියමනින් එතුමා කෘෂිකර්මයට දක්වූ රාජ්‍ය අනුග්‍රහය මැනවින් පෙන්නුම් කෙරෙයි.

## අනුරාධපුරය හා පොළොන්නරුව යුගවල කෘෂි සශ්‍රීකත්වයට හේතු වූ දියුණු වාරි කර්මාන්තය

එකල රජවරු කරවූ විශ්මිත නිර්මාණ නිසා ශ්‍රී ලංකාව ලොව පතල විය.

අනුරාධපුර යුගයේ තැනූ **ප්‍රථම වැව අභය වැව** වේ. (වර්තමානයේ බසවක්කුලම) පසු ව වසභ රජ සමයේ ස්ථාවර ආර්ථිකයක් සඳහා ජල තාක්ෂණ ක්‍රම දියුණු කිරීමට රාජ්‍ය අනුග්‍රහය ලැබීමත් සමඟ වැව් වපසරිය ක්‍රමයෙන් වැඩි විය.

මහසෙන් රජු කරවූ **මින්නේරිය වැවත්** ධාතුසේන රජු කරවූ **කලා වැවත්** සුවිශේෂ වාරි නිර්මාණ වේ. කලා වැව එම යුගයේ ජල සංරක්ෂණ සැලැසුමේ ජයග්‍රහණයක් ලෙස හඳුන්වයි.

ධාතුසේන රජු විසින් කරවන ලද **යෝධ ඇල** එවැනි සුවිශේෂ ඉංජිනේරුමය නිර්මාණයකි. පැරණි ඇල මාර්ගවල බැස්ම සැතපුමට අඟල් 12ක් වූ නමුත් කලා වැවේ සිට තිසා වැවට ජලය ගෙන යාමට සකස් කළ සැතපුම් 56ක් දිග 'ජය ගංගා' නම් ඇලෙහි (යෝධ ඇල) මුල් සැතපුම් 17 බැවුම් කිරීමේ දී සැතපුමට අඟල් 6ක් වන ලෙස බැවුම් කර තිබේ. මෙය විශ්මිත නිර්මාණයකි.

අඹන් ගඟ හරහා ඉදිකල වේල්ලක් මඟින් උතුරට ජලය ගමන් කරවීමට සැකසූ **ඇලහැර ඇල** තවත් විශ්මිත නිර්මාණයකි.

මහවැලි ගඟේ ජලය දිඹුලාගලට ගෙන යාමට සකස් කළ සැතපුම් 60ක් දිග **මිණිපේ ඇල** තවත් ප්‍රමුඛ නිර්මාණයකි. මෙය යකා බැඳි ඇල ලෙස ද හැඳින්වේ.

ජල තාක්ෂණයේ තවත් කැපී පෙනෙන වර්ධනයක් සිදු වූයේ පළමුවන පරාක්‍රමබාහු රජ සමයේ දී වේ. පුරාතන වාරිමාර්ග සභ්‍යත්වයේ මුදුන් මල්කඩ වන **පරාක්‍රම සමුද්‍රය** ඔහුගේ නිර්මාණයකි.


එම වකවානුවේ මැදුරුගම් ආරු, මහවැලි ගඟ, කලා ඔය, ජය ගංගා, මී ඔය ආශ්‍රිත ව ජල සම්පාදන ව්‍යාපෘති තිබුණි. ඒවා කෘෂි සශ්‍රීකත්වයට හේතු විය.

විශාල වැව්වලින් ජලය පිට වීම පාලනයට සකස් කළ **බිසෝ කොටුව** රජ සමයේ දියුණු වාරි තාක්ෂණය විදහා පෙන්වන තවත් සුවිශේෂ නිර්මාණයකි.



රූපය 1.4 : පැරණි බිසෝ කොටුවක්

මූලාශ්‍රය: *History of Sri Lanka*



### ඔබේ දැනුමට

ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනයේ **(International Water Management Institute-IWMI)** මූලස්ථානය 1984 වර්ෂයේ දී අප රටේ ස්ථාපනය කරන ලද්දේ ශ්‍රී ලංකාවේ ඉපැරණි හා දියුණු වාරි තාක්ෂණයට ගරු කිරීමක් වශයෙනි.

මෙම කරුණුවලින් අතීතයෙහි ලංකාවේ ස්වයංපෝෂිත කෘෂි ආර්ථිකයක් තිබූ බව මනා ව පැහැදිලි වේ. ජනතාව සරල ජීවන රටාවකට හුරුව සිටි අතර එකල පැවතුණේ යැපුම් කෘෂිකර්මය මත පදනම් වූ ආර්ථිකයකි.



රූපය 1.5 : වී ගොවිතැන

## යැපුම් කෘෂි ආර්ථිකය

අතීතයේ බොහෝ දෙනා ජීවත් වූයේ ගම්වල ය. ඔවුන් දෛනික ආහාර අවශ්‍යතාව ගොවිතැනින් සපුරා ගත්හ. ගොවිතැන සිදු වූයේ යැපුම් මට්ටමෙනි. මෙවැනි එදිනෙදා අවශ්‍යතා සඳහා වී ඇතුළු ව වෙනත් අතිරේක ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කරන ගොවිතැන් ක්‍රමයක් **යැපුම් කෘෂිකර්මය** ලෙස හඳුන්වයි.

ගම් ආශ්‍රිත ව කුඩා පරිමාණ වෙළෙඳපොළ විය. එහි වෙළෙඳ කටයුතු සිදු කළේ භාණ්ඩ හුවමාරු ක්‍රමයට ය.

විදේශ ආක්‍රමණවලට පසුව මෙම තත්ත්වය ක්‍රමයෙන් වෙනස් වී ආනයනය සහ අපනයනය මත පදනම් වූ **වාණිජ කෘෂි ආර්ථිකයක්** බවට පරිවර්තනය විය.

### පැවරුම 1.1

අපේ කෘෂි උරුමයන් පිළිබඳ පින්තූර රැස් කර මෙහි දැක්වෙන ආකාරයේ දින දර්ශනයක් නිර්මාණය කරන්න.

**පින්තූර සඳහා උදාහරණ**




වී බිස්ස
දිය හොල්මන
වැව
සෙක්කුව
ආඬියා ලිඳ
ටකය



නොමිලේ බෙදා හැරීම සඳහා ය.



රූපය 1.6 : කොකෝවා වගාවක්

16 වන සියවසට පසු පෘතුගීසි හා ලන්දේසි පාලන කාලවල දී කෘෂි ආර්ථිකයේ විශාල වෙනස්කම් ඇති නොවූ නමුත් බ්‍රිතාන්‍ය පාලන සමයේ දී වෙනස්කම් රැසක් ඇති විය.

වැවිලි බෝගවලට ප්‍රමුඛත්වයක් ලැබුණු අතර ග්‍රාමීය ගොවිතැන් රටාවේ වෙනස් වීම් ඇති වුණි. මෙහි දී ඉඩම් අයිතියේ හා පරිහරණයේ වෙනස්කම් ඇති වූ අතර සමහර ගොවීහු කම්කරුවන් බවට පත් වූහ. සාම්ප්‍රදයික ගොවි නිෂ්පාදන අඩු වීම ද සිදු විය.



රූපය 1.7 : කෝපි වගාවක්

වැවිලි බෝග ලෙස 19වන සියවසේ මුල් භාගයේ කෝපි වගාව හඳුන්වා දුන් අතර කුරුඳු ප්‍රධාන බෝගයක් ලෙස වගා කළහ. පසු ව සිංකෝනා හා කොකෝවා වගාවන් හඳුන්වා දෙන ලදී.

කෝපි වගාවේ අභාවයත් සමඟ තේ වගාව හඳුන්වා දුන් අතර ඒ සඳහා විශාල ප්‍රාග්ධනයක් අවශ්‍ය වූ හෙයින් ඒවා ව්‍යාපාරික ප්‍රජාවට පැවරුණි.

මේ සමඟ ම පොල් වගාව නිරිතදිග ප්‍රදේශයේ ව්‍යාප්ත වූ අතර බොහෝ දුරට සම්බන්ධ වූයේ දේශීය ව්‍යාපාරිකයන් ය.



රූපය 1.8 : රබර් වගාවක්

19 වන සියවස අග භාගයේ දි රබර් වගාව ආරම්භ කරන ලදි. රබර් ශාකය පළමුවෙන් ම රෝපණය කරන ලද්දේ ගම්පහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යානයේ දී ය. ලාංකිකයෝ මෙන් ම බ්‍රිතාන්‍ය වැවිලිකරුවෝ ද රබර් වගාවේ නිරත වූහ.

විසිවන සියවසේ මැද භාගයේ සිට කෘෂිකර්මය පදනම් කර ගත් ඉඩම් ප්‍රතිපත්තියක් බිහි වූ අතර පරිහානියට පත් වාරි පද්ධති ප්‍රතිසංස්කරණය කෙරුණි.



රූපය 1.9 : පොල් වගාවක්

තව ද නව වාරි පද්ධති පිළිබඳ ව ද ගොවිජනපද ව්‍යාපාර පිළිබඳ ව ද අවධානය යොමු විය. ගල්ඔය, මහවැලි, වලවේ, පදවිය, මින්නේරිය වැනි ව්‍යාපාර මෙයට උදාහරණ වේ.

**මෑත කාලයේ කෘෂිකර්මයේ විශාල වෙනස්කම් සිදු වූ සන්ධිස්ථාන**

1931 - ඩොනමෝර් ප්‍රතිසංස්කරණ අනුව රාජ්‍යමන්ත්‍රණ සභාව යටතේ දේශිය කෘෂිකර්මාන්තයේ ප්‍රබෝධයක් ඇති වීම.
1933 - බහුකාර්ය ගොවිජනපද ව්‍යාපාර ඇරඹීම.
1949 - සහතික මිල ක්‍රමය ඉදිරිපත් කිරීම.
1958 - කුඹුරු පනත ඉදිරිපත් කිරීම මඟින් අඳගොවි අයිතිය සුරක්ෂිත කිරීම.
1966 - විශේෂ කෘෂිකාර්මික සැලසුම් ඉදිරිපත් කිරීම මඟින් කෘෂි ඉඩම් බදු ක්‍රමය මත වගාවට ලබා දීම.
- ගොවිතැනට තරුණයන් නැඹුරු කරවීම.
1971 - පස් අවුරුදු සැලැස්ම ක්‍රියාත්මක කිරීම
සිට - කෘෂි සේවා මධ්‍යස්ථාන හා පලදාවර්ධන කමිටු පිහිටුවීම.
1977 - ආනයන සීමා පැනවීම.
- මහවැලි යෝජනා ක්‍රමය ආරම්භ කිරීම.
- ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ක්‍රියාත්මක කිරීම.



රූපය 1.10 : තේ වගාවක්



නොමිලේ බෙදා හැරීම සඳහා ය

1978 - මහවැලිය මඟින් විද්‍යානුකූල ජල පාලනයට යොමු වීම
- යැපුම් කෘෂිකර්මය වෘත්තිය කෘෂිකර්මය බවට පත් වීම
- විවෘත ආර්ථිකය හඳුන්වා දීම

1984 - වාරි ජලය ස්වාභාවික සම්පතක් ලෙස නොව අගයක් සහිත ව උපරිම ප්‍රයෝජනයට ගැනීම සඳහා ආකල්ප ඇති කිරීම
- කෘෂිකාර්මික ජනාවාස සැලසුම් කිරීම

1994 - ජල පෝෂිත ප්‍රදේශ කළමණාකරණය
- කුඩා ගොවිපොළ වාණිජකරණයට යොමු වීම

1995 -"අමා" සංකල්පය හඳුන්වා දීම

2005 - අවශ්‍යතාව අනුව කෘෂිකාර්මික යටිතල පහසුකම් ලබා දීම

2007 - අපි වවමු රට නගමු - වැඩ සටහන

## වර්තමාන කෘෂි කර්මාන්තය

දේශීය වෙළෙඳපොළ ඉලක්ක කර ගත් සම්ප්‍රදායික කෘෂිකර්මය හා විදේශ වෙළෙඳපොළ ඉලක්ක කරගත් වාණිජ කෘෂිකර්මය ලෙස පවත්නා නව නිෂ්පාදන රටාවක් මේ වන විට අප රටේ පවතී.

අපනයන වෙළෙඳපොළ ඉලක්ක කර ගත් සම්ප්‍රදායික නොවන කෘෂි ව්‍යවසායයන් රැසක් රට තුළ ව්‍යාප්ත ව ඇත. විසිතුරු මල් වගාව, ඉස්සන් වගාව, විසිතුරු මත්ස්‍ය වගාව, පැළ තවාන්, වාණිජ මී මැසි පාලනය, බිම්මල් වගාව, ආහාර පරිරක්ෂණය, අගය එකතු කිරීම හා විවිධාංගීකරණය මේ අතර ප්‍රධාන තැනක් ගනී.


විසිතුරු මල් වගාව


ආහාර පරිරක්ෂණය


බිම්මල් වගාව


විසිතුරු මත්ස්‍ය වගාව


පැළ තවාන්

රූපය 1.11 : වර්තමාන වාණිජ කෘෂි ව්‍යවසායන් කිහිපයක්

## 1.2 රට ආහාරවලින් සුරක්ෂිත කිරීමට දායක වෙමු.

මිලියන 19.7ක් වන ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතා සපුරාලීමට වර්තමාන කෘෂිකර්මය අපොහොසත් වී ඇති බැවින් සමහර නිෂ්පාදන ආනයනය කළ යුතු ව ඇත. මේ සඳහා අපගේ ජාතික ධනය අධික ලෙස විදේශයන්ට ඇදී යයි. මෙය වැළැක්වීමට දේශීය කෘෂිකර්මය සංවර්ධනය කළ යුතු ය.

දිවයින තුළ ප්‍රධාන කෘෂි නිෂ්පාදන ප්‍රමාණ හා ආනයන ප්‍රමාණ විමසීමෙන් මේ බව ප්‍රත්‍යක්ෂ කර ගත හැකි ය. (වගුව 1.1, වගුව 1.2, වගුව 1.3, වගුව 1.4)

වගුව 1.1 : ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදන ආනයනය සඳහා වැය කළ වියදම (රු. දශ ලක්ෂ)

| භාණ්ඩය | 2004 | 2005 | 2006 | 2007 | 2008 |
|---|---|---|---|---|---|
| සහල් | 6 186 | 1 554 | 576 | 4 261 | 4 730 |
| පිටි | 99 | 3 200 | 321 | 230 | 111 |
| සීනි | 11 240 | 13 303 | 23 256 | 17 055 | 22 326 |
| කිරි හා කිරි නිෂ්පාදන | 12 338 | 13 401 | 17 761 | 20 688 | 32 042 |
| වියලන ලද මාළු | 3 243 | 3 769 | 5 482 | 6 274 | 6 275 |
| වෙනත් මාළු | 2 606 | 3 220 | 4 165 | 5 741 | 6 348 |
| වෙනත් ආහාර | 24 736 | 22 963 | 27 294 | 37 603 | 50 565 |

*මූලාශ්‍රය : වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව* - 2009

**පැවරුම 1.2**

වගුව 1.1, 1.2 හා 1.3 හි දී ඇති දත්ත ප්‍රස්ථාරගත කර එම තොරතුරු විග්‍රහ කරන්න.



නොමිලේ බෙදා හැරීම සඳහා ය

වගුව 1.2 : වගා කන්න අනුව වී නිෂ්පාදනය
(මෙට්‍රික් ටොන්)

| දිස්ත්‍රික්කය | මහ (2004/2005) | යල (2005) |
|---|---|---|
| කුරුණෑගල | 211 245 | 108 670 |
| මුලතිව් | 33 863 | 8 737 |
| වව්නියාව | 28 934 | 4 934 |
| අනුරාධපුරය | 223 169 | 82 477 |
| පොළොන්නරුව | 230 608 | 209 846 |
| අම්පාර | 243 191 | 256 551 |
| මඩකලපුව | 94 394 | 50 882 |

*මූලාශ්‍රය : වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා මහ බැංකුව 2005*

වගුව 1.3 : ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි බෝග
වගා වපසරිය (හෙක්ටයාර දහස්)

| බෝගය | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 |
|---|---|---|---|---|---|---|
| තේ | 211 | 222 | 222 | 222 | 222 | 222 |
| රබර් | 115 | 116 | 118 | 120 | 122 | 124 |
| පොල් | 395 | 395 | 395 | 395 | 363 | 363 |
| වී | 779 | 937 | 910 | 816 | 1053 | 978 |

මූලාශ්‍රය : වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව - 2009

වගුව 1.4 : ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි නිෂ්පාදන ප්‍රමාණයන්

| බෝගය | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 |
|---|---|---|---|---|---|---|
| තේ (කි.ග්‍රෑ.දශ ලක්ෂ) | 309.4 | 317.2 | 310.8 | 305.2 | 318.7 | 289.8 |
| රබර් (කි.ග්‍රෑ.දශ ලක්ෂ) | 94.7 | 104.4 | 109.2 | 117.6 | 129.2 | 136.9 |
| පොල් (ගෙඩි දශ ලක්ෂ) | 2591.0 | 2515.0 | 268.4 | 286.9 | 290.9 | 276.2 |
| වී (මෙට්‍රික් ටොන් දහස්) | 2628.0 | 3246.0 | 334.2 | 3131.0 | 3875.0 | 3652.0 |
| මත්ස්‍ය නිෂ්පාදන (කි.ග්‍රෑ. දශ ලක්ෂ) | 286.0 | 163.0 | 251.0 | 291.0 | 319.0 | 340.0 |
| කිරි නිෂ්පාදන (ලීටර දශ ලක්ෂ) | 158.0 | 162.0 | 165.0 | 202.0 | 208.1 | 233.4 |
| බිත්තර නිෂ්පාදන (මාසිකව දශ ලක්ෂ) | 72.9 | 72.0 | 75.0 | 88.0 | 1039.8 | 95.1 |

මූලාශ්‍රය : වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව - 2009

**පැවරුම 1.3**

පොළොන්නරුව, අනුරාධපුරය, අම්පාර, හම්බන්තොට, මඩකලපුව යන දිස්ත්‍රික්කවල වී අස්වැන්නට එම ප්‍රදේශවල ඇති ප්‍රධාන වැව් දායක වන ආකාරය පිළිබඳ ව විමසුමක යෙදෙන්න.

## ආහාර සුරක්ෂිතතාව (Food Security)

සමාජයේ සෑම පුද්ගලයකුට ම තම පෝෂණ අවශ්‍යතා සපුරාගැනීම පිණිස අවශ්‍ය ආහාර වසර පුරා නොඅඩු ව ලබා ගැනීමට ඇති හැකියාව ආහාර සුරක්ෂිතතාව නම් වේ. මෙයින් අදහස් වන්නේ ජනතාවට අවශ්‍ය විවිධ ආහාර සුලබ ව තිබිය යුතු බව ය.

**අවශ්‍ය අවස්ථාවක දී, අවශ්‍ය ප්‍රමාණවලින්, නියමිත ගුණාත්මයෙන් යුක්ත ව, අවශ්‍ය ආහාර වර්ගයක් ලබා ගැනීමට ඇති හැකියාව ආහාර සුරක්ෂිතතාව ලෙස හැඳින්වේ.**

ජන සමාජයක් තුළ මනා පෝෂණ තත්වයක් ඇති වීමට නම් සුරක්ෂිත ආහාර සැපයුමක් පැවතිය යුතු ය. තව ද සෑම පවුලක් අතර ම සමසේ ආහාර බෙදී යාම අත්‍යවශ්‍ය වුවත් සමාන්‍යයෙන් එය එසේ සිදු නොවේ.

පුද්ගලයන්ගේ ආදායම අඩු වීම, අස්වනු අඩු වීම, පසු අස්වනු හානිය, වගා බිම් අඩු වීම, සිවිල් යුද්ධ, ඵලදායී නොවන ආර්ථික ප්‍රතිපත්ති වැනි කරුණු දියුණු වෙමින් පවතින රටවල ආහාර සුරක්ෂිතතාවට බලපායි.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ආහාර සුරක්ෂිතතාව තහවුරු කර ගත හැකි ආකාර

ආහාර සුරක්ෂිතතාව තහවුරු කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග මෙසේ ය.

(1) ප්‍රධාන ආහාර බෝගවල නිෂ්පාදනය වැඩි කිරීම

මෙහි දී වඩා වැදගත් වන්නේ සහල් නිෂ්පාදනය නැංවීම ය. ඒ සඳහා

- වගාකරුවන්ට උසස් ලක්ෂණ සහිත දෙමුහුම් බීජ ලබා දීම
- සහන මිලට පොහොර ලබා දීම
- ගොවීන්ට තාක්ෂණික දැනුම ලබා දීම
- සහතික මිලට වී මිලදී ගැනීම
- වගා රක්ෂණ ක්‍රම හඳුන්වා දීම
- වාරි ජලය ලබා දීම

(2) ගෙවතු කෘෂි කර්මාන්තය ප්‍රචලිත කිරීම

(3) ප්‍රධාන ආහාරවලට ආදේශක ලෙස යොදා ගත හැකි කොස්, දෙල්, බතල, රාජ අල, හිඟුරල, මඤ්ඤොක්කා, කුරක්කන් වැනි දේශීය ආහාර ජනතාව අතර ප්‍රචලිත කිරීම

(4) ප්‍රෝටීන් මන්දපෝෂණය දුරලීම සඳහා මාෂ බෝගවල වැදගත්කම පිළිබඳ ව දැනුවත් කිරීම

(5) ධීවර නිෂ්පාදනය නැංවීම

(6) අංග සම්පූර්ණ පෝෂණීය අගයකින් යුත් ලාභදායී ආහාරයක් ලෙස, කිරි සහ කිරි ආහාර ප්‍රචලිත කිරීම


(7) එළවළු සහ පලතුරු ආහාරයට ගැනීමේ වැදගත්කම පිළිබඳ ව දැනුවත් කිරීම

(8) අස්වනු හානි අවම කිරීම සඳහා පසු අස්වනු පරිහරණය පිළිබඳ ව දැනුවත් කිරීම

(9) අස්වැන්න හා එහි පෝෂණීය අගය නැංවීම සඳහා තාක්ෂණය යොදා ගැනීමට ගොවීන් දැනුවත් කිරීම

(10) නීති මඟින් හෝ බදු පැනවීම මඟින් ආනයනය සීමා කිරීම

(11) ගබඩා පහසුකම් වැඩි දියුණු කිරීම



### ඔබේ දැනුමට

ජීවීන් හා ජීවී ක්‍රියාදාම මිනිසාගේ අවශ්‍යතා සපුරා ගැනීම පිණිස යොදා ගැනීම ජෛව තාක්ෂණය ලෙස සරල ව හැඳින්විය හැකි ය.



දෙල්




කොස්

රූපය 1.12 : ආදේශක ආහාර



මුං



කව්පි



සෝයා බෝංචි

රූපය 1.13 : දේශීය ව සුලබ මාෂ බෝග



නොමිලේ බෙදා හැරීම සඳහා ය

## 1.3 පෝෂණ අවශ්‍යතා සපුරා ගනිමු.

දෛනික ව අවශ්‍ය ශක්තිය ලබා ගැනීම, වර්ධනය වීම හා රෝගවලින් ආරක්ෂා වීම සඳහා මනා පෝෂණයක් අවශ්‍ය වේ. කාබෝහයිඩ්‍රේට්, ප්‍රෝටීන්, ලිපිඩ, විටමින් හා ඛණිජ ලවණ හා ජලය මිනිසාගේ පෝෂණයේ දී වැදගත්වන පෝෂක වේ. මෙම පෝෂකවලින් පරිපූර්ණ වූ සමබල/මිශ්‍ර ආහාරයක් අනුභව කිරීම ඉතා වැදගත් ය.

**පහත දක්වා ඇති සාධක අනුව පුද්ගලයකුගේ ආහාර අවශ්‍යතාව වෙනස් වේ.**

- වයස
- ස්ත්‍රී පුරුෂ බව
- රැකියාවේ ස්වභාවය
- ගර්භණී බව
- මව් කිරි දීම
- සෞඛ්‍ය තත්වය

වගුව 1.5 : ලාංකිකයන් සඳහා නිර්දේශිත දෛනික පෝෂක අවශ්‍යතා

| අවධිය | ශරීර බර ( කි.ග්‍රෑ.) | ශක්තිය (කිලෝ කැලරි) | ප්‍රෝටීන් (ග්‍රෑ.) | විටමින් A (මි.ග්‍රෑ) | යකඩ (මි.ග්‍රෑ.) | කැල්සියම් (මි.ග්‍රෑ.) |
|---|---|---|---|---|---|---|
| මධ්‍යස්ථ පිරිමි | 65 | 3000 | 37 | 750 | 8-15 | 400-500 |
| මධ්‍යස්ථ ගැහැණු | 55 | 2200 | 29 | 750 | 16-22 | 400-500 |
| ළමයින් (අවු. 1) | 7.3 | 820 | 14 | 300 | 6-13 | 500-600 |
| තරුණ පිරිමි (අවු. 13-15) | 51.3 | 2900 | 37 | 725 | 12-24 | 600-700 |
| තරුණ ගැහැණු (අවු. 13-15) | 49.9 | 2490 | 31 | 725 | 13-27 | 600-700 |
| ගර්භණී කාන්තාවන් | 47 | 2100 | 38 | 750 | 16-32 | 1000-1200 |
| කිරිදෙන මව්වරුන් | 47 | 2650 | 46 | 1200 | 9-17 | 1000-1200 |

වගුව 1.6 : ආහාර වර්ගවල පෝෂක ප්‍රතිශත (ග්‍රෑම් 100ක)

| ආහාරය | ශක්තිය (කි.කැ.) | ප්‍රෝටීන් (ග්‍රෑ) | විටමින් A (මි.ග්‍රෑ) | විටමින් C (මයික්‍රො.ග්‍රෑ) | කැල්සියම් (මි.ග්‍රෑ.) | යකඩ (මි.ග්‍රෑ.) |
|---|---|---|---|---|---|---|
| කැකුළු හාල් | 345 | 6.8 | - | - | 10 | 3.1 |
| තිරිඟු පිටි | 341 | 12.1 | - | - | 48 | 11.5 |
| කුරක්කන් | 348 | 7.3 | - | - | 344 | 6.4 |
| රතු පරිප්පු | 343 | 25.1 | - | - | 69 | 4.8 |
| මුං ඇට | 334 | 24.0 | - | - | 124 | 7.3 |
| අර්තාපල් | 97 | 1.6 | - | 17 | 10 | 0.7 |
| බතල | 120 | 1.2 | - | 24 | 46 | 0.8 |
| කුකුළු මස් | 109 | 25.9 | - | - | 25 | - |
| බිත්තර | 173 | 13.3 | 360 | - | 60 | - |
| බල මාළු | 105 | 21.0 | - | - | - | - |
| හාල්මැස්සන් | 408 | 48.1 | - | - | 356 | 3.7 |
| බෝංචි | 48 | 3.8 | - | 9 | 210 | 1.7 |
| වට්ටක්කා | 25 | 1.6 | - | 2 | 0 | 0.7 |
| එළකිරි | 67 | 3.2 | 57 | 2.0 | 120 | 0.2 |
| කංකුං | 28 | 2.9 | - | 137 | 110 | 3.9 |
| නිවිති | 26 | 2.0 | - | 28 | 73 | 10.9 |
| අඹ | 74 | 0.6 | - | 16 | 14 | 1.3 |
| නෙල්ලි | 58 | 0.5 | - | 600 | 50 | 1.2 |

*මූලාශ්‍රය : පෝෂණය සඟරාව - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව*

### පැවරුම 1.4

දිනක් තුළ ඔබ ලබා ගත් ආහාර ලැයිස්තු ගත කර එම ආහාරවල පෝෂණීය වැදගත්කම හා අවදානම් තත්ව පිළිබඳ ව තක්සේරුවක් කරන්න.

### ඔබේ දැනුමට

පුද්ගලන්ගේ ආදායම, සාක්ෂරතාව, ජනගහන වර්ධන වේගය, ආයු අපේක්ෂණය, මරණ අනුපාතය, අධ්‍යාපන මට්ටම, පෝෂණය ආදී දර්ශක අනුව රටක සංවර්ධන මට්ටම තීරණය කරනු ලැබේ.

ප්‍රෝටීන් ශක්ති මන්ද පෝෂණය, නිරක්තිය, විටමින් ඌනතාව, ගලගණ්ඩය, කැල්සියම් ඌනතාව ශ්‍රී ලංකාවේ සංවර්ධනයට බහුල ව බලපෑම් ඇති කරන පෝෂණ ඌනතාවන් වේ.

### පැවරුම 1.5

පුද්ගලයන්ගේ පෝෂණ මට්ටම නැංවීම ට රජයෙන් ක්‍රියාත්මක කරන වැඩසටහන් විමසා වාර්තාවක් සකස් කරන්න.

### අත්වැලක්

මහ බැංකු වාර්තාව, ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තු වාර්තා, කෘෂිකර්ම දෙපාර්තමේන්තු වාර්තා ආදිය මඟින් අමතර තොරතුරු ලබා ගත හැකි ය.




නොමිලේ බෙදා හැරීම සඳහා ය

## සංවර්ධනය සඳහා පෝෂණයේ වැදගත්කම

යම් පුද්ගලයකුගේ පෝෂණය කෙරෙහි ආදායම, අධ්‍යාපන මට්ටම, ජීවත් වන පරිසරය ආදිය බලපාන බව ප්‍රත්‍යක්ෂ කරුණකි. අඩු ආදායම්ලාභී බහුතරයක් ශ්‍රී ලාංකිකයන් පෝෂණ අවදානමකට ගොදුරු වී ඇත. එම නිසා ඔවුන් ශ්‍රම බලකායට හවුල් කර ගැනීමට අපහසු වේ. මෙය රටේ සමස්ත සංවර්ධනයට බලපායි.

### පුද්ගලයන්ගේ පෝෂණ මට්ටම නැංවීමේ ක්‍රම

- ආදායම් මට්ටම වැඩි කිරීම
- පෝෂ්‍යදායී ආහාර සුලබ කිරීම
- සාගත වැළැක්වීම
- පෝෂණ අධ්‍යාපනය ලබා දීම





ප්‍රස්තාරය 1.1
2005 වසරේ දී සේවා නියුක්තිය

*මූලාශ්‍රය : වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව 2005*


## 1.4 සංවර්ධනයට කෘෂිකර්මය දායක කර ගනිමු.

රටක ආර්ථික සංවර්ධනය සඳහා භාණ්ඩ හා සේවා ප්‍රමාණය වැඩි කිරීමට සමගාමී ව සමාජ සංවර්ධනය ද කළ යුතු ය.

කෘෂිකර්මයෙන් සමාජ සංවර්ධනයට මනා පිටුවහලක් ලැබේ. අප රටේ උසස් කෘෂි විභවයක් ද පවතී. එබැවින් දේශීය ආර්ථිකය නැංවීම ට වඩා යෝග්‍ය වන්නේ කෘෂි ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම යි.




2000 වසරේ දී දායකත්වය




2005 වසරේ දී දායකත්වය

ප්‍රස්තාරය 1.2
දළ දේශීය නිෂ්පාදනයට විවිධ ක්ෂේත්‍රයන් හී දායකත්වය

*මූලාශ්‍රය : වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව 2005*

## ආර්ථික සංවර්ධනයේ දී කෘෂි කර්මාන්තයෙන් ඉටු කළ හැකි මෙහෙය

- වැඩි වන ආහාර ඉල්ලුම සපුරාලීම
- පෝෂණ අවශ්‍යතා සපුරාලීම
- අපනයනය මඟින් විදේශ විනිමය උපයා දීම
- විරැකියාව අඩු කිරීම
- ගොවිපොළ යෙදවුම් සඳහා ඉල්ලුම වැඩි කිරීම
- යටිතල පහසුකම් දියුණු කිරීම
- නිමි නිෂ්පාදන වැඩි කිරීම
- දේශීය සංස්කෘතිය නැංවීම

වගුව 1.7 : අපනයන ආදායම (රු. දශ ලක්ෂ)

| වර්ෂය | තේ | රබර් | පොල් | වෙනත් කෘෂි නිෂ්පාදන | අලුත් හා ශීත කළ මාළු | ලුණු දැමූ මාළු | කවචයෝ හා මෘද්වංශීන් |
|---|---|---|---|---|---|---|---|
| 2005 | 81 482 | 4 724 | 11 400 | 18 439 | 6 413 | 265 | 3 211 |
| 2006 | 91 667 | 9 674 | 12 898 | 20 242 | 10 093 | 235 | 3 192 |
| 2007 | 113 565 | 12 089 | 15 636 | 25 655 | 13 650 | 386 | 3 936 |
| 2008 | 137 600 | 13 537 | 18 532 | 31 069 | 14 818 | 394 | 2 627 |
| 2009 | 136 171 | 11 327 | 19 091 | 27 616 | 15 939 | 353 | 3 321 |

*මූලාශ්‍රය : වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව - 2009*

### ඔබේ දැනුමට

ශ්‍රී ලංකාවට 1700 km දිග වෙරළ තීරයක් හා වෙරළේ සිට 200 km දක්වා විහිදෙන 500 000 $km^2$ කට වඩා ආවරණය වන අනන්‍ය ආර්ථික කලාපයක් (Exclusive Economic Zone - **EEZ**) ඇත.

මිරිදිය මත්ස්‍ය හා ජල ජීවී වගාවන් සාර්ථක ව සිදු කිරීමට වසර පුරාම ජලය පවත්නා හා ජල මට්ටම අඩු වැඩි වන වැව් හා ජලාශ 170 000 ha හා ජල ජීවී වගාවට යෝග්‍ය වෙරළබඩ තටාක 15 000 ha පමණ තිබේ.

*මූලාශ්‍රය : රජයේ සංදේශය- 1999 දෙසැම්බර්*

## මූලික ඉලක්ක සපුරාලීමට කෘෂිකර්මය දියුණු කළ හැකි ද?

කෘෂිකර්මය සඳහා හොඳ විභවයක් අප රට සතු ව පවතින බැවින් කෘෂිකර්ම සංවර්ධනය පහසුවෙන් කළ හැකි වේ.
එම විභවයන් මෙසේ ය.

- මෙතෙක් වගාවන් සඳහා යොදා නොගත් එහෙත් වගා කළ හැකි බිම් රැසක් පවතී.



නොමිලේ බෙදා හැරීම සඳහා ය

### පැවරුම 1..6

පහත දැක්වෙන තේමාවන් අනුව කරුණු ගොනු කරමින් **කෘෂිකර්මයෙන් රට ගොඩ නැංවීම** යන මාතෘකාව යටතේ පුවත් පතක පළ කිරීමට සුදුසු ලිපියක් ලියන්න.

- කෘෂිකර්මය සඳහා ඇති විභවය
- කෘෂිකර්මයේ දායකත්වය
- අනාගතයේදී සපුරා ගත හැකි ඉලක්ක

- සත්ත්ව පාලනයට යොදා ගත හැකි ඉඩකඩ බහුල ය.
- බෝග වගාව හා සත්ව පාලනයට යෝග්‍ය පාරිසරික තත්ව ප්‍රශස්ත ව තිබේ.
- විරැකියාවෙන් පෙළෙන ජනතාව කෘෂි කර්මාන්තයට හවුල් කර ගත හැකි ය.
- ජල සම්පත් සුලබ ව පවතී.
- නව කර්මාන්ත සඳහා දේශීය හා විදේශීය ව්‍යාවසායකයන් සම්බන්ධ කර ගැනීමේ හැකියාව ඇත.
- කෘෂි නිෂ්පාදන සඳහා දේශීය හා විදේශීය වෙළඳපොළ පහසුකම් පවතී.
- දැනුම හා සේවා ලබා දෙන ආයතන රට පුරා ව්‍යාප්ත ව තිබේ.
- කෘෂි සංවර්ධනයට වැදගත් රාජ්‍ය ප්‍රතිපත්ති ඇත.
- යටිතල පහසුකම් හොඳ මට්ටමේ පවතී.
- ධීවර කර්මාන්තය නැංවීමට විභවයක් පවතී.
- අභිජනන බීජ හා සතුන් ලබා ගැනීමට හැකියාව ඇත.
- විදේශීය වෙළඳපොලට පහසුවෙන් භාණ්ඩ සැපයීමට සුදුසු ස්ථානයක ශ්‍රී ලංකාව භූ ගෝලීයව පිහිටා තිබීම.

**දැන් මට**

- කෘෂිකර්මය නිර්වචනය කිරීමට,
- අතීතයේ පැවැති කෘෂිකාර්මික සශ්‍රීකත්වයට සාක්ෂි ඉදිරිපත් කිරීමට,
- ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ සිදු වූ වෙනස්කම් විස්තර කිරීමට,
- ආහාර සුරක්ෂිතතාව යන සංකල්පය විස්තර කිරීමට,
- ආහාර සුරක්ෂිතතාව තහවුරු කර ගත හැකි ආකාර විස්තර කිරීමට,
- සංවර්ධනය සඳහා පෝෂණය වැදගත් වන ආකාරය විස්තර කිරීමට,
- පුද්ගලයන්ගේ පෝෂණය නැංවීමේ ක්‍රම සඳහන් කිරීමට,
- ආර්ථික සංවර්ධනය සඳහා කෘෂි කර්මාන්තයෙන් ඉටු කළ හැකි මෙහෙය විස්තර කිරීමට,
- ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය නැංවීමට ඇති විභවය විස්තර කිරීමට

**හැකි ය.**

### අගයමු

**ගැටලු විසඳීමේ හැකියාව අගයමු.**

අතීතයේ දී කෘෂි නිෂ්පාදන අපනයනය කළ අපට අද වෙනත් රටවලින් සමහර ආහාර ද්‍රව්‍ය ගෙන්වන තුරු බලා සිටීමට සිදු වී ඇත. මෙම ගැටලුව විසඳීමට බොහෝ පුද්ගලයන් වෙර දැරුව ද තවමත් සතුටුදායක පිළිතුරක් ලැබී නැත.

1. මෙම තත්වයට හේතුව කුමක් විය හැකි ද?
2. අප රටට ආනයනය කරන එහෙත් දේශීය ව අවශ්‍ය ප්‍රමාණය නිපදවීමට හැකියාව ඇති කෘෂි නිෂ්පාදන 5ක් නම් කරන්න.
3. ඒ සඳහා පවතින විභවය කෙටියෙන් පහදන්න.

**කුසලතා අගයමු.**

2000-2005 කාලසීමාව සඳහා වී වගා වපසරිය හා නිෂ්පාදනය ප්‍රස්තාර ගත කරන්න.

**නිර්මාණශීලිත්වය අගයමු.**

ශ්‍රී ලංකාව ට වඩා උචිත යැපුම් කෘෂිකර්මය ද ? වාණිජ කෘෂිකර්මය ද?යන මැයෙන් විවාදයක් පවත්වන්න.

**පාරිභාෂික වදන් එකතුව**

| | |
|---|---|
| ආහාර සුරක්ෂිත බව | - food security |
| පෝෂණය | - nutrition |
| සොරොව්ව | - sluice gate |
| වාරි තාක්ෂණය | - Irrigation technology |
| කෘෂි සංවර්ධනය | - agricultural development |
| පෝෂණ අවශ්‍යතා | - nutritional requirement |



නොමිලේ බෙදා හැරීම සඳහා ය